කෙටි කතාව

# සිද්ධ - අර්ථ




**හේමලාල් විද්‍යාරත්න**
දුම්රිය ස්ථානාධිපති
මහනුවර,
ශ්‍රී ලංකාව
E mail :- lalvidya@yahoo.com

හාමුදුරුවෝ කොහාටද?
අටේ එකක් දෙන්ට.
ජුබිලි කණුවට එහාද මෙහාද ?
ඒක නම් හරියටම දන්නේ නෑ.
දැන ගන්න එපායැ.
මහත්තයට කැමති ගානක් ගන්න.
කල්පනාවක............
සල්ලි එපා හාමුදුරුවනේ.
බසයේ සියල්ල විශ්මයෙන් ඇලලෙති.
පිං සිදුවේවා.
මහත්තයා ඉස්සරහ නැවතුමේ මම බහිනවා.
ටිං..
මහත්තයටත්, රියදුරු මහත්තයටත්, බස්එකේ යන පින්වතුන්ටත්, පාරේ යන පින්වතුන්ටත් තෙරුවන් සරණයි.
හාමුදුරුවො කින්ඩියට නෙවේ නේද කිව්වේ?
මද සිනාවක්....
අරි අරී යන් යන් යන්....
ආනන්ද විවේකාරාමය...
විශේෂ දැන්වීමක්.
සතර දෙසින් වඩිනා භික්ෂූන් උදෙසා පූජා කොට ඇත.
ඊට පහලින් කැලෑ පත්තර කෑල්ලක්....
යටිතල පහසුකම් සඳහා සුළු මුදලක් අය කරණු ලැබේ.
ආපු ගමන් අනිමිසේ දාන්නේ නැතිව මෙහාට එනවා.
එහෙමයි.
ආ....යූ..ෆොම්?
අනුරාධපුරේ ඉඳලා...
තමුන්ට කඩුව බෑ ?
පාළි සංස්කෘත පුළුවන්.
අහපුදේට විතරක් උත්තර දෙනවා.
නිහඬතාවයක්.....
තමුන්ගේ නම?
සිද්ධාර්ථ
සමුපූර්ණ නම
මාකෙහෙල්වල සිද්ධාර්ථ
මචං මෑන් බොස්ගේ නම දාගෙන.
තමුන්ට මෙහේ බොස්ගේ නම විකුනගෙන කන්න දෙන්න බෑ. මක්කලී ෂෝසාලගේ වෙබ් එකෙන් නමක් දෙන්න වෙනවා.
මක්කලී මෙයාගේ අළුත් නම මොකක්ද?
මොහුගේ මුල නාමයේ ම යන්නත්, අග නම සම්පූර්ණයෙනුත් ලොප් විය යුතු බව මක්කලීගෙ ' අදහසයි.
එසේනම් තමා අද සිට කෙහල්වල යන්න භාවිතා කල යුතුයි. කෙහෙල්වල යන්න කීම තරමක් අපහසු නිසා තමාට තව දුරටත් අනුකම්පාකොට කෙහෙලා යනුවෙන් ආමන්ත්‍රනය ලැබීමට සලස්වනවා.
එහෙමයි.
සිනා.
කොහාටද යන්න කැමති?
නිවනට.
තමුන් අපිව සෙල්ලමකට ගත්තද?
භික්ෂූන් සමග සෙල්ලම් කිරීම විනයට පටහැනියි.
කථාව නවත්තනවා තමුසේ ආවේ විනය කර්මේ කරන්නද ?
නිහඬතාවයක්.....
තමා යන්න කැමති සැවත් නුවරටද? ජේතවනාරාමෙටද? වේළුවනේටද? කැමති එකක් ඉක්මනට කියනවා.
බෞද්ධ රැගයක්.....
කෙටි නිහඬතාවයක්......
ඉක්මනට
සැවැත් නුවරට
ආවාස ගෙය වටේ රවුම් දහ අටක්.
නික්මයති.
එකයි, දෙකයි, තුනයි,.....
කොහොමද සැවැත් නුවර හොඳද ?
මද සිනාවක්....
කේන්ති ගියාද?
මොකටද?
ඇවිද්දුවට?
අලව් යකා බුදුන්වත් ඇවිද්දුවේ.
ඒ කියන්නේ අපි යක්කු තමුසේ බුදුන්?
තේරුම් ගැනීම වැරදීයි.
තමා රවුම් දහඅට යද්දි ඔය කථාව මතක් කර ගත්තද අපිට කියන්න?
නෑ
එහෙනම්?

**විශ්ව විද්‍යාලයේ මොන පක්ෂයටද බැඳෙන්න ඉන්නේ?**
**බුද්ධ දර්ශනය අනුව කටයුතු කරනකොට ද්වේශ කරන්න බෑ.**
**තමා කියන්නේ පක්ෂයකට වැඩ කිරීම ද්වේශයක් කියලද?**
**නෑ මෝහයත් ටිකක් තියෙනවා.**
**තමාට ඔය අන්දමින් විශ්ව විද්‍යාලයේ ඉන්න ලැබෙයිද?**
**කියන්න අපහසුයි.**
**එතකොට?**
**මෛත්‍රී කරනවා.**
**තමන්ට විරුද්ධව විශ්ව විද්‍යාලයේ අවි එසවුවහොත්?**
**බුදුන්ටත් ගල් පෙරලුවා.**
**තමා බුදුන් වගේද?**
**නෑ එතුමන්ගේ ශ්‍රාවකයෙක්.**

**ධර්මෙන්මද වැඩ කරන්න හිතාගෙන ඉන්නේ?**
**ඒක අපේ උරුමය.**
**උරුමේ කරුමේ වෙන වෙලාවලුත් තියෙනවාද?**
**නෑ කරුමේ තමයි නිතරම උරුමේ වෙන්නේ.**

සක්මන් භාවනාවක යෙදුනා මිසක් කිසිම දෙයක් හිතන්න ගියේ නෑ.
ධර්මෙන්මද වැඩ කරන්න හිතාගෙන ඉන්නේ?
ඒක අපේ උරුමය.
උරුමේ කරුමේ වෙන වෙලාවලුත් තියෙනවාද?
නෑ කරුමේ තමයි නිතරම උරුමේ වෙන්නේ.
මහන්සිද?
ඔව්
ඒ ඇයි?
අනුරාපුරෙන් පිටත්වුනේ පාන්දර තුනට
එමු ඇතුලට
මේකයි තමුන්ගේ කාමරේ. ඇඳට මෙට්ටයක් ගන්ට වෙයි.
ඇඳක් ඕන නෑ.
එතකොට සැතපෙන්නේ හිරමනේ උඩද?
බිම.
බිම?
අපිස් ජීවිතය හොඳට හුරුයි.
බිම සැතපෙනවා නම් එලියේ උනත් හොඳයිනේ?
කමක් නෑ එළියේ සැතපිලා හොඳට හුරුයි.
එතකොට අවශ්‍ය මොනවද?
පොත් පත් ටික තියාගන්න තැනක්.
ඒ මොකද පොත්පත් වලට විශේෂ තැනක් ?
වැස්සෙන් පින්නෙන් ඒවා ආරක්ෂා කර නොගත්තොත් ඒවා විනාශ වෙනවා.
එතකොට තමුන්ට වැස්සෙන් පින්නෙන් හානියක් නැද්ද?
තරමක් දුරට තියෙනවා. ඒත් බොහෝ දුරට වැස්ස පින්න අපට ඔරොත්තු දෙනවා.
එතකොට තමුන්ගේ අනිකුත් ඒවා තියාගන්නේ?
අනිකුත් ඒවා මුකුත් නෑ සිවුරු විතරයි.
සිවුරු තියාගන්නේ?
එකක් වැලේ අනික ඇඟේ.
සිනා...
සිවුරු දෙකක් ඇතිවෙයිද?
ප්‍රමානය ඉක්මවා ගියහම හිතට කරදරයි.
වැහිදාට සිවුරු වේලගන්නේ කොහොමද?
එදාට සිවුරු වේලෙනවා හොරයි. අඳින සිවුර කිලිටි වෙනවාත් අඩුයි.
රෑට වළඳනවද?
නෑ
ඉගෙන ගන්නකොට ශරීරයට පෝෂනය ඕනැ වෙනවා.
බඩගින්නේ ඉඳගෙන පාඩම් කරන්න පුළුවන්ද?
මනසට ආහාරය දැනුමයි.
බුදුන් ලඟට බණ අහන්න ආව සමහර අයගේ කුසගින්න නිවලයි බුදුන් බණ කිව්වේ. ඒවා බොරුද ?
වේල් ගනනක් කුසගින්නේ සිටීමයි, එක වේලක් ආහාර නොගෙන සිටීමයි අතර සම්බන්ධයක් නෑ.
ශරීරයට කෑම ඕනෑ ටිකයි. වැඩිපුර ඒවා ඕන වෙන්නේ හිතට
එතකොට දානේ මෙහෙන් ගන්නවද පිටින් ගන්නවද?
ලැබෙන හැටියක්
මෙහේ උනත් දානේ ගන්නවනම් සල්ලි ගෙවන්න වෙනවා
පිඬුසිඟා වැඩීමයි පුරුද්ද.
කෝපාවිෂ්ඨ බැල්මක්....
මෙහේ පිණ්ඩ හිගමනේ යන සිරිතක් නෑ
බුදුසිරිත ඒකයි
පිඬුසිඟා වඩින්න කාලයක් තියේවිද?
උදෙන්ම වඩිනවා
මෙහේ අය පිඬු සිඟමන් දෙයිද?
අරාබි කරේට ගියත් ලැබෙන බව විස්වාශයි.
ඒ කියන්නේ තමුන්ට දානේ වැරදිලාම නැද්ද?
මුර දානේ වැරදිලා තියෙනවා
එදාට
කහට උගුරකින් ගඩා ගෙඩියකින් වේල පිරිමහ ගන්නවා.
හවස්වෙලා දානේ ලැබුනොත්?
වලඳනවා.
බඩගින්න නිසා ශික්ෂාපදේ කඩනවා?
එලිවෙනකන් බඩගින්නේ පෙළෙනවාට වඩා කෑම ටිකක් කාලා කයත් මනසත් සන්සුන් කර ගන්නවා.
එහෙනං අපි රෑට කන එකත් වැරදි නෑ නේද?
එතන දෙවිදියක්.
ඊයේ දානෙට මොනවද වැලඳුවේ?
වට්ටක්කා හොද්දකුයි, කරකොල මැල්ලුමකුයි.
ඒ ඇද්ද?
ශරීරය පවත්වාගෙන යාමට ප්‍රමානවත්.
ඔය විදියට වලඳලා විටමින ඌන තාවයක් ඇතිවුනොත්?
එහෙම වෙන්නෙ නෑ.
කොහොමද කියන්නේ?
ගෙදරක සාමාජිකයෝ දහ දෙනෙක් ඉන්නවා. එක් අයෙකුට රෝගයක් හැදෙනවා. දොස්තර මහත්තයා කියනවා විටමින ඌනතාවයක් කියලා. ඒත් ඒ ආහාරම ගන්නා අනිත් නම දෙනාටම ඒ රෝගය නෑ.
ඒ උනාට විටමින් දුන්නම අර රෝගියා සුවපත් වෙනවා.
විටමින් කියන ජාතිය ඒ අවස්ථාවේ ක්‍රියා කරන්නේ ඖෂධයක් හැටියට. අපි ගන්නා ඕනෑම දෙයක් ශරීරය පාවිච්චි කරන්නේ ඉන්ධනයක් විදියට. අවශ්‍ය බොහෝ පදාර්ථ ඕනෑම ආහාරයක තියෙනවා. අපි ගන්නා හුස්මේ පවා තියෙනවා. සුලගෙන් පමනක් වර්ධනය වන මල් පැළෑටි පවා දැන් සොයාගෙන තිබෙනවා.
ගුරු හාමුදුරුවොද කියා දුන්නේ?
ගුරු හාමුදුරුවොත්, පත පොතිනුත්, භාවනා කිරීමෙනුත් හිතට පහලවූ ඒවා.
අළුත් දර්ශනයක්ද?
නෑ බුද්ධ දර්ශනයමයි.
විශ්ව විද්‍යාලයේ මොන පක්ෂයටද බැඳෙන්න ඉන්නේ?
බුද්ධ දර්ශනය අනුව කටයුතු කරනකොට ද්වේශ කරන්න බෑ.
තමා කියන්නේ පක්ෂයකට වැඩ කිරීම ද්වේශයක් කියලද?
නෑ මෝහයත් ටිකක් තියෙනවා.
තමාට ඔය අන්දමින් විශ්ව විද්‍යාලයේ ඉන්න ලැබෙයිද?
කියන්න අපහසුයි.
එතකොට?
මෛත්‍රී කරනවා.
තමන්ට විරුද්ධව විශ්ව විද්‍යාලයේ අවි එසවුවහොත්?
බුදුන්ටත් ගල් පෙරලුවා.
තමා බුදුන් වගේද?
නෑ එතුමන්ගේ ශ්‍රාවකයෙක්.
රාජ්‍ය පාලනයට සම්බන්ධ වුනොත් මිනිසුන්ට සේවය කරන්න පුළුවන් කියලා හිතනවද?
නිහඬතාවයක්......
නිහඬවෙලා ප්‍රශ්න මග අරින්න බෑ. ඉක්මනට කියනවා.
සංඝ බේදයකට තුඩු දිය හැකි පිළිතුරක් නිසා ප්‍රකාශ කල නොහැකියි.
බේද නොවුනු සංඝ පරම්පරාවක් ඉන්නවා කියලද තමා හිතන්නෙ? ඉක්මනට ප්‍රශ්නෙට උත්තර කියනවා.

30 වන පිටුවට